**සංචාරක සංවර්ධන අරමුදල - 2019**

**--------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

සංචාරක සංවර්ධන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංචාරක සංවර්ධන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අයකරනු ලැබූ සියයට 0.5 ක සංචාරක සංවර්ධන බද්ද රු. 3,384,455 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් වශයෙන් හා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ හා ගෙවිය යුතු වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත් නොකර ගෙවිය යුතු වටිනාකම රු. 1,626,609 ක් පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අය කරනු ලැබූ සංචාරක සංවර්ධන බද්ද රු. 3,384,455 මුදලින් රු.1,757,846ක මුදලක් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර ඇත. උපචිත වියදම රු.1,626,608 ක මුදල මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ හැක්කේ බැංකු සැසඳුම් පිළියෙල කර රිසිට් පත් පරීක්ෂා කිරීමෙන් පසුවය. | සමාලෝචිත වර්ෂයේ අය කරනු ලැබූ සංචාරක සංවර්ධන බදු මුදල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්විය යුතු බව. |
| (ආ) | 2019 නොවැම්බර් මස 06 දිනැති අංක අමප/19/2797/123/110 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී අපගමන බදු ආදායමෙන් පලාලි ගුවන් තොටුපලේ සංවර්ධනය සඳහා භාවිත කරනු පිණිස අරමුදලට ලැබිය යුතු මුදලින් රඳවාගන්නා ලද රු. 801,376,894 ක මුදල හා තවදුරටත් ගෙවිය යුතු රු. 248,623,106 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීම්වලට එකතු කිරීමට ක්‍රියාකරනු ලැබේ. | අරමුදලට ලැබියයුතු මුදලින් රඳවා ගන්නා ලද මුදල හා තවදුරටත් ගෙවියයුතු මුදල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම කළ යුතු බව. |

### 1.5.2 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත | | | |
| • III වන පරිච්ඡේදයේ 23(2)(අ) වගන්තිය | • ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් එකතු කර අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලබන අපගමන බදු ආදායමින් 1/3 ක කොටසට අදාලව සමාලෝචිත වර්ෂයේදී සේවා ගාස්තු ලෙස සියයට 2.5 ක් හෙවත් රු.74,119,772 ක් අඩු කර ගැනීම සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සලසා නොතිබුණි. | සියයට 2.5 සේවා ගාස්තුව රදවා ගැනීමට 2009 ජනවාරි 29 දින අංක PF/R/4/019 යන ලිපියෙන් මහා භාණ්ඩාගාරය එකග වූ බව දක්වා ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව. |
| | • වගන්තිය ප්‍රකාරව එකතු කරනු ලබන අපගමන බදු ආදායමෙන් තුනෙන් එකක් (සියයට 33 1/3) අරමුදලට ලැබිය යුතුය. එසේ වුවද, පනතේ වගන්තිය සංශෝධනයෙන් තොරව 2016 දෙසැම්බර් 27 දිනැති අංක 1999/24 දරන | කෙසේ වෙතත් 2016 වර්ෂයේ අයවැය තුළින් මුදල් අමාත්‍යංශය ඇ.ඩොලර් 35ක මුදල් ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරයට ලබා දෙන ලෙස නියෝග කර ඇත. ඉතිරි වන ඇ.ඩොලර් 15ක මුදලින් තුනෙන් එකක ප්‍රමාණයක් අරමුදලට ලැබේ. | පනතේ වගන්ති සංශෝධනය කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | අති විශේෂ ගැසට් නිවේදනයේ විධිවිධාන හා 2016 දෙසැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය අනුව අය කරනු ලබන ඇ. ඩොලර් 50ක මුදලින් ඇ. ඩොලර් 05ක් පමණක් අරමුදලට ලැබී තිබුණි. මේ සම්බන්ධව පනතට අදාල සංශෝධනය කිරීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| • 24(3) වගන්තිය | වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සකස් කර නොතිබුණි. එසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත පරිපාලන වියදම් වශයෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 4,732,256 ක් ගෙවා තිබුණි. | පරිපාලන වියදම් සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. | සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා අදාල රීති සකස් කළ යුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ආදායම රු.මිලියන 3,036 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම රු.මිලියන 4,318 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායමෙහි රු.මිලියන 1,282 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි අපගමන බදු ආදායම රු.මිලියන 735 කින් අඩු වීම හා සංචාරක සංවර්ධන බදු ආදායම රු.මිලියන 558 කින් අඩු වී තිබීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 අංක 25 දරන මුදල් පනතේ 2(ආ) උපවගන්තිය අනුව ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියෙකු සඳහා නිකුත් කරන සෑම ටිකට් පතකින්ම බදු අයකර ඉන් කොටසක් අරමුදල වෙත ප්‍රේෂණය කල යුතු වුවත් එලෙස නැව් මඟින් ගමන්කරන මගීන්ගෙන් බදු අයකර අරමුදල වෙත එවා නොතිබුණි. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු වලට අනුව 2019 වර්ෂය තුලදී මඟීන් 100,614 ක් පිටත්ව ගොස් ඇති බැවින් ඒ වෙනුවෙන් එක් මඟියෙකුගෙන් ඇමරිකානු ඩොලර් 1.66 ක් බැගින් සමාලෝචිත වර්ෂයට අදාළව අරමුදලට ලැබිය යුතු ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් 167,019ක් එනම් රු. 29,729,382 ක අපගමන බදු ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෙළඳ නාවික ලේකම් කාර්යාලය මගින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට දන්වා ඇත්තේ ශ්‍රී ලංකාවෙන් නැව් මගින් පිටවන මගීන් සඳහා අපගමන බදු අය කිරීමට ක්‍රමවේදයක් නොමැති බවයි. | පනතේ 2 (ආ) උපවගන්තිය අනුව නැව් මගින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියෙකු සඳහා නිකුත් කරන සෑම ටිකට් පතකින්ම බදු අය කර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බැංකුවට සෘජුව ප්‍රේෂණය කරන ලද රු. 1,187,785 ක් වසරක් ඉක්මවා ඇතත් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | එම මුදල්වලට අදාල විස්තරාත්මක තොරතුරු හඳුනා ගැනීමෙන් අනතුරුව ඒවා බදු ආදායමක් ලෙස ගිණුම් තැබීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | බැංකුවට කර ඇති සෘජු ප්‍රේෂණ නිවැරදිව හඳුනා ගෙන ගිණුම් යාවත්කාලීන කිරීමට ක්‍රමවේදයක් ඇති කළ යුතු බව. |